# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2208/31 - 2020 දෙසැම්බර් මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2020.12.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xiv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4)(ආ) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී. එල්. පීරිස් වන මා විසින්, මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ විද්‍යා ආයතනයේ, පරිපාලන කටයුතු බරපතල ලෙස ව්‍යාකූල වී ඇති බවට සහ එය සාමාන්‍ය තත්වයට නැවත පත් කිරීමට එම ආයතනයේ බලධාරීන් අපොහොසත් වී ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂක වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී මොරටුව විශ්වවිද්‍යාලයේ, තාක්ෂණ විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ වෙනුවට නිසි බලධරයා වශයෙන් ආචාර්ය චමින්දලාල් සුජීව ලෙවන්ගමගේ 2021 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත් කරමි.

**මහාචාර්ය ජී. එල්. පීරිස්,**
අධ්‍යාපන අමාත්‍ය.

2020 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.


1A - PG 5228 — 521 (2020/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*